මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 06 2018 අගෝස්තු 24

# මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 05 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධාන පහත දැක්වෙන විධාන මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

3. වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම්

3.1 ඉහත විධාන 2 හි දැක්වෙන සීමාවන් පහත දැක්වෙන ණය පහසුකම් සඳහා අදාළ නොවේ:

(i) පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු නොකිරීමේ කොන්දේසියට යටත්ව තම මූලික ව්‍යාපර කටයුතු සඳහා උපයෝගි කර ගැනීමට වාහන සංචිත මිලදී ගන්නා සංචාරක සහ / හෝ ප්‍රවාහන කටයුතුවල නිරත සමාගමකට ප්‍රදානය කරනු ලබන ණය පහසුකම්:

(ii) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරන ලද කල්බදු මූල්‍ය ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය කිරීම සඳහා රජයේ නියෝජිත ආයතන වෙත ලබා දෙන ණය පහසුකම්; සහ

(iii) රජය මගින් ලබා දීමට යෝජිත සහනදායී කල්බදු මූල්‍ය පහසුකම යටතේ රාජ්‍ය සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන්ට සහ දුෂ්කර ප්‍රදේශවල සේවයේ නියුතු ගුරුවරුන්ට යතුරු පැදි මිලදී ගැනීමට ප්‍රදානය කරනු ලබන ණය පහසුකම්.

3.2 මෙවැනි ණය පහසුකම් ලබා දීමේදී බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර, ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**